7

# විරාම ලක්ෂණ

කතාබහ කිරීමේ දී වචන හෝ වාක්‍ය නැවැත්විය යුතු තැන නවත්වා, හඬ උස් පහත් කර, කියවන වේගය අඩු වැඩි කර කියවීමෙන් කියවන්නාගේ අදහස් අන් අයට වඩාත් හොඳින් වටහා දීමට පිළිවන. අංග චලන, මුහුණේ ඉරියව් ආදිය ද උපකාර කර ගෙන එය තවත් හොඳින් කළ හැකිය. එහෙත් ලේඛනයේ දී ඒ සියල්ල වෙනුවට යොදා ගනු ලබන්නේ විරාම ලක්ෂණ නමැති සලකුණු විශේෂයකි.

නැවතීමේ තිත, කොමාව, ප්‍රශ්නාර්ථය, විස්මයාර්ථ ලකුණ ආදි සලකුණු, විරාම ලක්ෂණ වශයෙන් යෙදේ. මේ පාඩමේ දී අවධානය යොමු කරනු ලබන්නේ පහත සඳහන් විරාම ලක්ෂණ තුන කෙරෙහි පමණි.

- ♦ තිත ( . )
- ♦ ප්‍රශ්නාර්ථ ලකුණ ( ? )
- ♦ විස්මයාර්ථ ලකුණ ( ! )

විරාම යන වචනයෙහි මූලික අදහසක් වන්නේ නැවතීම යන්න යි. ඉහත විරාම ලක්ෂණ යොදා ඇති තැන්වල දී යම් නැවතීමක් සහිත ව වාක්‍ය කියවීමෙන් අදහස වඩාත් හොඳින් වටහා ගත හැකි වෙයි.

## තිත .

විරාම ලක්ෂණයක් වශයෙන් තිත යෙදෙන ප්‍රධාන අවස්ථා දෙකක් කෙරෙහි අවධානය යොමු කරමු.

1 වාක්‍ය අවසානයේ යෙදෙන නැවතීමේ තිත

උදාහරණ - රාහුල හිමියෝ දන් වළඳති.

2 වචනයක් හෝ වචන කෙටි කර දැක්වීමේ දී හෙවත් කෙටි යෙදුම් සඳහා තිත යෙදේ.

උදාහරණ - විමල හිමියෝ දිනපතා අවදි වන්නේ පෙ. ව. හතරට ය.
මෙහි පෙ. ව. යනුවෙන් යෙදුණේ '*පෙරවරු*'යන වචනය කෙටි කර දැක්වීමට යි.
- අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය සාමාන්‍යයෙන් පැවැත්වෙන්නේ දෙසැම්බර් මාසයේ දී ය.
මෙහි අ. පො. ස. යනුවෙන් යෙදුණේ '*අධ්‍යයන*', '*පොදු*', '*සහතිකපත්‍ර*' යන වචන කෙටි කර දැක්වීමට ය.

** තිත යොදා වචන කෙටි කර දැක්වීමේ දී දීර්ඝ කාලයක් ගත වී බොහෝ දෙනා දන්නා හුරු පුරුදු වචන බවට පත් වූ පසු සමහර වචන කෙටි කිරීමට යොදා ගත් තිත ඉවත් වී නාම පද වශයෙන් භාවිත වනු දැකිය හැකි ය.*

උදාහරණ - ලංකා ගමනාගමන මණ්ඩලය > ල. ං. ග. ම. > ලංගම
- සමුපකාර තොග සංස්ථාව > ස. තො. ස. > සතොස

***කෙටියෙන් දැක්විය යුතු වචන කිහිපයක් තිබෙන විට මුල් ම වචනයේ මුල් අකුර සමග 'ං' යෙදුණහොත් උච්චාරණයේ පහසුව සඳහා එම බින්දුව හෙවත් අනුස්වාරය ද සමග කෙටි යෙදුම භාවිත කරයි. එහෙත් කෙටි කරන වචන කිහිපයේ අන්තිම වචනයේ මුලකුර සමග අගට යෙදෙන 'ං' අත්හැරී. දක්වා ඇති උදාහරණ වැකි මැනවින් පිරික්සා බලන්න.***

## ප්‍රශ්නාර්ථ ලකුණ ?

ප්‍රශ්නයක් විමසන වාක්‍යයක අවසානයේ යෙදේ.

උදාහරණ - මේ ගසේ බොහෝ පැණි දොඩම් තිබේ ද?
- මේ අඹ ගස හැර වෙනත් අඹ ගස් තිබේ ද?
- ශ්‍රී ලංකාවේ දිග ම ගඟ කුමක් ද?

ඉහත උදාහරණවල මෙන් ප්‍රශ්නයක් විමසන බොහෝ වාක්‍ය අවසානයේ 'ද' අකුර යෙදී තිබෙනු දැකිය හැකි යි. එහෙත් ඊට වෙනස් පහත උදාහරණ බඳු අවස්ථා ද පවතී.
- බොහෝ පැණි දොඩම් තිබේ ද, මේ ගසේ?
- තිබේ ද, බොහෝ පැණි දොඩම් මේ ගසේ?

යම් අවිනිශ්චිත හෝ සැකයක් සහිත වාක්‍යයක් ලිවීමේ දී ද ප්‍රශ්නාර්ථ සලකුණ යෙදේ.

උදාහරණ - ඈය දිනුවා?
- තවත් සුනාමියක්?

# විස්මයාර්ථ ලකුණ !

මෙම විරාම ලක්ෂණය, 'හර්ෂාදි ලකුණ', 'ආශීර්වාද ලකුණ' යන නම්වලින් ද හැඳින්වේ. එය විස්මය, සතුට, දුක, පිළිකුල වැනි හැඟීම් දැනවීමට මෙන් ම ආමන්ත්‍රණයක්, ආශිර්වාදයක් පළ කිරීමටත් ලේඛනයේ දී යෙදේ. වාක්‍යයක හෝ වාක්‍ය ඛණ්ඩයක අග මෙන් ම වෙනත් ස්ථානවලත් යෙදේ.

උදාහරණ

- ඔහුට ලොතරැයිය ඇදුණා!
- අහා! ප්‍රීතියි.
- අහෝ ඛේදයකි!
- චී! චී! ගෙරි මස් නොකනු.
- රාජ පුරුෂය! වහා එහි යව.
- සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා!

# කුසලතා වර්ධනයට:

1 සුදුසු විරාම ලක්ෂණ යොදා පහත වාක්‍ය සම්පූර්ණ කරන්න.

i මම නිදුක් වෙම්වා
ii රංවල හිමියෝ දනට වැඩම කළෝ ය
iii දායිකාව ගිලන්පස පිළිගැන්වූවා ද
iv අනේ දෙවිදත් නොදිටි මොක් පුර
v ඔහු ද මේ භයානක සොරා
vi ඇතා නගුලක් වාගේ යැයි එක් අන්ධයෙක් කී ය
vii එම්බල දුෂ්ටය නුඹ මේ අහිංසක සතා මැරුවේ කුමන සිතකින් ද
viii සුබ නව වසරක් වේවා
xi සතියකට දින කීයක් තිබේ ද
x අහෝ සිදු වූ විපතක මහත

2 සුදුසු විරාම ලක්ෂණ යොදා පහත සදහන් ඡේදය ඔබේ අභ්‍යාස පොතේ ලියන්න.

දුම්කොළ දැවෙන විට පිට වන දුමාරය කැටි ගැසීමෙන් ජනිත වන ලාටු වර්ග දුම්කොළ තාර ලෙස හඳුන්වනු ලබයි මහාමාර්ග තැනීමට භාවිත කරන්නේ තාර බව ප්‍රකට කරුණකි සිගරට්ටුවක් හෝ බීඩියක් ඉරූ විට තාර ශ්වසන පද්ධතියේ පතිත වන්නේ ය ඒ තාර පෙණහලුවල ඇතුළු පැත්තේ සෛල ස්තරය උත්කෝපනය කරයි (හානි කරයි) එය පිළිකාකාරකයකි.

3 වැරදි ලෙස යෙදී ඇති විරාම ලක්ෂණ සුදුසු පරිදි ස්ථානගත කරන්න.

i නා මල සුවඳැති මලකි!
ii පුඤ්ඤානන්ද හිමියෝ මනා හික්මීමක් ඇති හිමිනමක් වූහ?
iii මැණියෝ නිරෝගී වෙත්වා.
iv පියාණෝ නිදුක් වෙත්වා?
v ජනනි කුඩා දැරියකි!
vi අහෝ . නුඹට කුමක් සිදු වී ද!
vii ගොවිතැන ධාර්මික ජීවනෝපායකි?
viii කලට වැසි වසීවා?
xi අහා? බුදු ගුණ මහිමය ආශ්චර්යයකි?
x ලෝකයට සාමය උදා වේවා.